

2015 2016 2017



පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79

ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ

පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றத்தின் வெளியீட்டுத் தொடர் இலக்கம் :79

நிறுவனத்தின் பெயர்: மாவட்ட பெயலகம் கம்பஹ

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வவக்கப்பட்ட அறிக்வக ததாடர்பாக நிவையியற் கட்டவை ைிக்கம் 119(4) இன் கீழ் தகௌரவ அவமச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது ததாடர்பாக எடுக்கப்படும் நடவடிக்வகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Serial No: 79

Name of Institution: District Secretariat – Gampaha

Submission of observation of Hon Minister in charge of the institution and steps taken with regard to the reports tabled by the committee on Public Account in terms of Standing Order No.119(4)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය: ගම්පහ

රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු මා මඟපෙන්වීම්	ගත් ක්‍රියාමාර්ගය හා වර්තමාන ප්‍රගතිය
1. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ඇති සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටුව අවම ප්‍රමාණයෙන් හෝ රැස්ව නැත.	• වර්ෂිකව දිස්ත්‍රික් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් (කාර්තුවට 01 බැගින්) පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව 2023 වර්ෂයේ අදාල රැස්වීම් 04 නියමිත පරිදි පවත්වා ඇත. • ප්‍රාදේශීය විගණන හා කළමණාකරන කමිටුව වර්ෂය තුලදී එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට, ප්‍රාදේශීය විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. (කාර්තුවට 01 බැගින්) 2024 වර්ෂය තුල නියමිත පරිදි ප්‍රාදේශීය විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර ඇත.
2. 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුලත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත කාල රාමුව තුළ විගණකාධිති වෙත යොමුකර ඇත. අතිරික්තතා මේ වන විට බඩු වට්ටෝරු පොතට ඇතුළත් කර ඇත. ඌණතා ලෙස පෙන්නුම් කළ භාණ්ඩ නැවත පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වෙනත් ගබඩා තුළ තිබී හමු වූ බැවින් ඌණතා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු නොකරන අතර මේ වන විට ඒවා නිවැරදි ස්ථානවල ස්ථානගත කර ඇත.

3. සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි.	වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට මිල ගණන් කැඳවා ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
4. අනුයුක්ත කල සංවර්ධන නිලධාරීන් හැර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බදවාගෙන තිබුණි.	රාජ්‍ය ප්‍රතිපත්තියක් මත අදාල බහුකාර්ය සේවකයින් බඳවාගෙන ඇති අතර, අදාල චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ගෙවීම් කටයුතු සිදුකර ඇත. මේවන විට එම සේවයේ නියුතු සේවකයින් ස්ථිර කර විවිධ ආයතන වල සේවයට යොදවා ඇත.
5. මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ සිට නියමිත පරිදි අදාල කමිටු රැස්වීම් පවත්වාගෙන යනු ලැබේ .
6. 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපණත අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් මාසිකව පවත්වා නොතිබුණි.	ගම්පහ දිස්ත්‍රික්කය අඩු කෘෂිකර්ම විභවයක් සහිත දිස්ත්‍රික්කයක් බැවින් මාසිකව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව පැවැත්වීම සිදු නොකරයි. අවස්ථානුකූලව අවශ්‍යතාවය පරිදි දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි.
7. දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	2024 වර්ෂයේ සිට දිස්ත්‍රික් නිවාස කමිටුව මසකට වරක් පැවැත්වීමට කටයුතු කර ඇති අතර ඉදිරියටත් මාසිකව අදාල රැස්වීම පැවැත්වීමට කටයුතු කරමි.
8. දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි.	මෙම කමිටුව මාසිකව රැස් නොවන්නේ පොහොර වැඩසටහන පිළිබඳව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී සහ කන්න රැස්වීම්වලදී සාකච්ඡා කරන බැවිනි. ඒ ඒ බෝග වගාවන්හි පොහොර අවශ්‍යතාවය සහ එහි ප්‍රගතිය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී සහ කන්න රැස්වීම්වලදී සාකච්ඡා කරන ලදී. කෙසේ වෙතත් අදාල කමිටු රැස්වීම් 2024 වර්ෂයේ සිට මාසිකව පැවැත්වීමට කටයුතු කරමි.

9. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි.	මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව ලෙස වෙනම කමිටු පවත්වා නොමැති අතර සෑම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී මාසිකව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වල ප්‍රගතිය විමසීමට ලක් කරයි.
10. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වී නොතිබුණි.	ඉඩම් පරිහරණ කමිටුවක් පවත්වනු ලබන්නේ දිස්ත්‍රික්කයට ලැබී ඇති ඉඩම් පරීක්ෂණ වෙනුවෙන් සකස් කරන ලද ඉඩම් යෝග්‍යතා වාර්තා සඳහා කමිටු නිර්දේශය ලබා දීම වෙනුවෙනි. 2022 පළමු කාර්තුවේ ප්‍රමාණවත් ඉඩම් ඉල්ලීම් නොලැබී තිබුණු හෙයින් එම කාර්තුවේ කමිටුව නොපැවැත්වුණි. දෙවන කාර්තුව තුළ ලැබුණු ඉල්ලීම් 2022.08.16 දින කමිටුවක් පවත්වන ලදී. අවසන් කාර්තුව සඳහා 2022.11.29 දින දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව පවත්වන ලදී. ඉඩම් ඉල්ලීම් ප්‍රමාණය සලකා මෙම කමිටු පවත්වන බැවින් 2023 වසරේ කමිටු 02 ක් සහ 2024 වසරේ 01 කමිටුවක් පවත්වා ඇත.
11. සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කෙරෝනා වසංගතය හේතුවෙන් සැලසුම් කල පුහුණු වැඩසටහන් පැවැත්වීම ප්‍රමාද වූ අතර 2023 වර්ෂයේ සිට පුහුණු වැඩසටහන් පැවැත්වීමට ක්‍රියා කරමින් පවතී. 2023 වසරේ ICTA NextGenGov වැඩසටහන යටතේ රාජ්‍ය නිලධාරීන් 150 ක් පුහුණු කිරීම. 2023 වසරේ ඉ - ග්‍රාම නිලධාරී පුහුණුව යටතේ ග්‍රාම නිලධාරීන් 824 ක් පුහුණු කිරීම 2024 වසරේ දින 10 වැඩසටහන යටතේ කළමනාකරණ සේවා නිලධාරීන් 104 ක් පුහුණු කිරීම 2024 වසරේ නවක ග්‍රාම නිලධාරීන් 173 දෙනෙකු සේවාරම්භක පුහුණුව මාස 03 ක් පැවැත්වීම. සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිවරුන්ට හා එක් විෂය නිලධාරියකුට රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ (Government Pay Roll System) දින 03ක සම්පූර්ණ පුහුණුවක් KDU ආයතනයට යොමුකර ලබාදීමට කටයුතු කර ඇත.

12. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	වසර 05 කට වඩා එක් සේවා ස්ථානයක සේවය කරන නිලධාරීන්ගේ නාම ලේඛන ස්ථාන මාරු මණ්ඩලය වෙත යොමුකර ඇත. වාර්ෂික ස්ථාන මාරු හා අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට සියලුම නිලධාරීන් දැනුවත් කර ඇත. 2025 වාර්ෂික ස්ථාන මාරු කැඳවා ඇති අතර වසර 05 කට වඩා එක් සේවා ස්ථානයක සේවය කරන නිලධාරීන්ගේ තොරතුරු වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කරමින් පවතී.
13. දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස්වී නොතිබුණි.	2024 වර්ෂයේ සිට පරිසර කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීම කටයුතු සිදුකරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.

ලලින්ද ගමගේ
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය

එල්.ඒ.බී.එල්.ගුණසේන
ප්‍රධාන ගණකාධිකාරි ,
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය.

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සෞඛ්‍යමය අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය